**ශීර්ෂය - 9 පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළමතය**

---

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2021 මැයි 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත නිකුත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීදැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අක් මුදල් ගැලැපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 7(vi) ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු හෝ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අගයන් ගැලපුම් කිරීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කළ යුතු වුවද අධිකාරය විසින් එම ගිණුම පිළියෙල කර නොතිබුණි. | අක්මුදල් ගැලපුම් ගිණුමක් සකස් නොකළ අතර ඉදිරියේදී එපරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කළ යුතු වීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**දේපළ පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හා ACA – 6 ආකෘතියේ දේපළ පිරියත හා උපකරණ ලෙස රු.20,478,200ක් දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහනේ දේපළ පිරියත හා උපකරණ වටිනාකමක් දක්වා නොතිබුණි. ආයතනය විසින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සකස් කිරීමේදී අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ කේවල ගිණුම් ශේෂ සසදා නොතිබුණි. | අධිකාරය විසින් දේපළ පිරියත උපකරණ මිලදී ගන්නා සෑම අවස්ථාවකදීම වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවන අතර ඒවා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට ඇතුළත්වී නොතිබුණි. මේ පිළිබඳ භාණ්ඩාගාරය විමසා නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ කේවල ගිණුම් ශේෂ සමඟ සැසඳිය යුතුවීම |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

----------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් නොවන ලැබීම් රු.411,953 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි. | ආදායම් නොවන ලැබීම් රු.411,953 ක මුදල අග්‍රිම ලැබීම් ශේෂයට ඇතුළත් කර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම |
| (ආ) | අග්‍රිම ලැබීම් රු.27,840,000 ක් වුවත් එය රු.28,714,253 ක් ලෙස දක්වා තිබුණි. | ආදායම් නොවන ලැබීම් හා අත්තිකාරම් අයකර ගැනීම් රු.458,900 ක් ඇතුළුව රු.28,714,253 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා ඇත. | -එම- |
| (ඇ) | පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් රු.28,542,996 ක්වුවත්එයරු.28,666,396 ක් ලෙස දක්වාතිබුණි. | පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතට අත්තිකාරම් ගෙවීම් රු.12,000 ක්, දුම්රිය බලපත්‍ර ගාස්තු රු.3,400 ක්ද ඇතුළුව මෙම වියදම සමන්විත විය. | -එම- |
| (ඈ) | අත්තිකාරම් අයකර ගැනීම් රු.458,900 ක් හා අත්තිකාරම් ගෙවීම් රු.120,000 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා නොතිබුණි. | රු.458,900 ක්වූ අත්තිකාරම් අයකර ගැනීම් අග්‍රිම ලැබීම් යටතේද රු.120,000 ක්වූ අත්තිකාරම් ගෙවීම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත. | -එම- |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ2020 දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය නිවැරදිව දක්වා නොතිබුණි. | අතපසුවීමකින් මුදල් ශේෂය සටහන් කර නොතිබුණි. | -එම- |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උපරිම වියදම් සීමාවහා අවම ලැබීම් සීමාව පිළිවෙලින් රු.1,500,000 ක් හා රු.400,000 ක් ලෙස විසර්ජන පනතේ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල පැවතියද, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට එම සීමාවන් පිළිවෙලින් රු.1,200,000 ක් හා රු.120,000 ක් ලෙස දක්වා තිබුණි. | අත්තිකාරම් බී ගිණුම පිළියෙල කරන අවස්ථාව වන විට ලැබී තිබුණු ඇස්තමේන්තු ප්‍රකාරව සීමාවන් දැක්වීමට කටයුතු කළ නමුත් සංශෝධන සහිත සීමාවන් දැක්වෙන ඇස්තමේන්තුව ලැබෙන විට අත්තිකාරම් බී ගිණුම විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. එබැවින් උපරිම හර සීමාව අවම ලැබීම් සීමාව නිවැරදි ලෙස ඇතුළත් කළ නොහැකි විය. | ගිණුමේ සීමාවන් නිවැරදිව දැක්විය යුතු වීම |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට පවිත්‍රතා සේවාව ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව බැංකු සුරක්ෂණය මාස 12 ක කාලයකට ලබා දිය යුතු වුවද මාස 03 ක කාලසීමාවකට පමණක් ලබාදී තිබුණි. | 2020 වර්ෂයේ මාර්තු මසදී කොවිඩ් 19 වසංගතය රටපුරා පැතිරීමත් රාජ්‍ය ආයතන වසා දැමීමත්, රට සාමාන්‍ය පරිදි වැඩ කළ හැකි තත්ත්වයට පත්වීමට 2020 සැප්තැම්බර් මාසය දක්වා ගත වීමත් නිසා බැංකු සුරක්ෂණය ඉදිරිපත් කිරීමට සැපයුම්කාර සමාගමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත් 2020 සැප්තැම්බර් මස 24 දින සම්පත් බැංකුව විසින් නිකුත් කරන ලද අංක 303720200033 දරන සුරක්ෂණ සහතිකය ඉදිරිපත් කර ඇත. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **---------------------** | | **-----------------------** | **-----------** |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව 17 ක් වීමත් කොවිඩ් 19 වසංගත තත්ත්වයත් හමුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ප්‍රායෝගික නොවේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අනුමත තනතුරු 31 න් තනතුරු20 ක් පුරප්පාඩුව පැවතියද එම පුරප්පාඩු සඳහාසුදුසු නිලධාරීන් බඳවා ගැනීමට අපොහොසත් වී තිබුණි. එසේම 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු දෙකක්,තෘතීය මට්ටමේ එක් තනතුරක්, ද්වීතීයික මට්ටමේ තනතුරු 03ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් සඳහා නිලධාරීන් හා සේවකයින් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. | මේ වන විට බඳවා ගැනීමේ පරිපාටි සකස් කර අධිකරණ සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට කටයුතුකළ යුතු වීම. |